ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සන්නිවේදන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2014 අගෝස්තු මස 21 වැනි දින |

**ශ්‍රී ලංකා මහ බැංකුව, ඇමෙරිකා එක්සත් ජනපදය තුළ සිදු කරන තම සන්නිවේදන වැඩසටහන අඛණ්ඩව සිදු කරයි**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඇමෙරිකානු එක්සත් ජනපදය තුළ ශක්තිමත් සන්නිවේදන වැඩසටහනක් 2013 මාර්තු සිට දියත් කරන ලද අතර මේ සඳහා 2013 මාර්තු මාසයේ සිට 2014 ජූනි මාසය දක්වා තොම්සන් ඇඩ්වයිසරි ගෲප් එල් එල් සී ආයතනයේත්, 2014 අගෝස්තු මාසයේ සිට ලිබර්ටි ඉන්ටර්නැෂනල් ගෲප් එල් එල් සී ආයතනයේත් දායකත්වය ලබා ගන්නා ලදී.

මෙම සන්නිවේදන වැඩසටහන තුළින් ශ්‍රී ලංකාවේ දේශපාලනික සහ ආර්ථික පරිසරය පිළිබඳව ඇමෙරිකා එක්සත් ජනපදය තුළ නිසි අවබෝධයක් ඇති කිරීමටත්, එමගින් ශ්‍රී ලංකාවේ දිගුකාලීන දේශපාලනික සහ ආර්ථික අභිලාෂයන් ඉහළ නැංවීම මෙන්ම එක්සත් ජනපදයේ ආයෝජකයන් හා අනෙකුත් පාර්ශවයන් හට ශ්‍රී ලංකාව පිළිබඳ පැහැදිලි සහ නිවැරදි තොරතුරු ලබා ගත හැකි පුළුල් ක්‍රමවේදයක් ඇති කිරීමත්, අපේක්ෂා කරන අතර ඒ හරහා පෞද්ගලික අංශයේ ආයෝජනයන් විශාල වශයෙන් ශ්‍රී ලංකාව තුළට ආකර්ෂණය කර ගැනීමට හැකි වනු ඇත. මෙම සන්නිවේදන වැඩසටහන මුදල් නීති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වගකීමට ලක්කොට ඇති ආර්ථික හා මිල ස්ථායීතාවය සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවය යන පුළුල් අරමුණු ළඟා කර ගැනීමට දායක වන අයුරින් මෙන්ම ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය සඳහා දිරිගැන්වීම සහ ප්‍රවර්ධනය ද අරමුණු කොට ගෙන ක්‍රියාවට නංවා ඇත.

රට තුල පැවැති ගැටුම් අවසන් වීමෙන් අනතුරුව ගත වූ පසුගිය වසර කිහිපය පුරාවට විදේශයන්හි වාසය කරන සමහර සංවිධානාත්මක කණ්ඩායම්, ඇතැම් ජාත්‍යන්තර මෙන්ම දේශීය මාධ්‍යයන් සහ සමහර දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් විශාල වශයෙන් අරමුදල් යොදවා ශ්‍රී ලංකාවට එරෙහිව සිදු කරනු ලබන අතිමහත් හානිදායක ප්‍රචාරයන් පිළිබඳ නිසි අවධානය යොමු කොට ඒවා අභියෝගයට ලක් කිරීම හා නිසි පිළිතුරු සැපයීමත් නොකළහොත් ඒ මගින් ශ්‍රී ලංකාව පිළිබඳව ජාත්‍යන්තර ආයෝජකයන් අතර ඇති විශ්වාසය පලුදු වීමටත්, එමගින් රටේ ආර්ථික වර්ධනයට ඇති විය හැකි අහිතකර බලපෑම හා අවදානම ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි සැලකිල්ලට හා විමර්ශණයට භාජනය කරන ලදී. මෙම වාතාවරණය තුළ මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ආර්ථික හා දේශපාලන තත්ත්වයන් පිළිබඳ නිවැරදි හා යථා තත්ත්වය පිළිබඳව ජාත්‍යන්තරය තුළ විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය, නිසි අවබෝධයක් ඇති කිරීම සඳහා ජාත්‍යන්තර වෘත්තීමය ආයතනයක සහාය ලබා ගැනීමට තීරණය කරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපද ආයෝජකයන් විසින් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ජාත්‍යන්තර සෛවරීත්ව බැඳුම්කර, කොටස් ආයෝජන හා සෘජු ආයෝජනවල සිදු කර ඇති සැලකිය යුතු ආයෝජන ප්‍රමාණය හා සසඳා බැලීමේ දී මෙකී ප්‍රයත්නය ඉතාමත් වැදගත් පියවරක් වේ.

පසුගිය මාස කිහිපය තුළ සිදු කරන ලද ශක්තිමත් සන්නිවේදන ප්‍රයත්නය තුළින් ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික තත්ත්වයන් පිළිබඳ වඩා නිවැරදි වූත්, තුලිත වූත් අවබෝධයක් ඇමෙරිකා එක්සත් ජනපද සෙනට් සභිකයින්, කොංග්‍රස් සභිකයින්, බුද්ධි මණ්ඩල සාමාජිකයන්, වෙළෙඳ සංගම් සාමාජිකයන් ඇතුළු ඉහළ මට්ටමේ ඇමෙරිකානු නායකයින් ද ඇතුළත් වූ ඇමෙරිකානු ජනතාව අතර ඇති කිරීමට හැකි වී තිබේ. එක්සත් ජනපද ආයෝජකයන් විසින් විශේෂයෙන්ම බැංකු අංශය ද ඇතුළත්ව සිදු කරන ලද සැලකිය යුතු මට්ටමේ ආයෝජනයන් මෙන්ම ඇමෙරිකානු නායකයින්, බුද්ධිමතුන් සහ පුරවැසියන් තුළ ශ්‍රී ලංකාව පිළිබඳව වඩාත් තුළනාත්මක අවබෝධයක් හා දැක්මක් ඇති වෙමින් පැවතීම ද ඇතුළු සතුටුදායක ප්‍රතිඵල ඉහත වැඩසටහන හරහා දැනටමත් ලැබෙමින් පවතී.